ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
**කොළඹ**

**පුවත්පත් නිවේදනය**

<u>ශ්‍රී ලංකාවේ පැවැත්වෙන පූජනීය දෙවෙනි මෝරි සර්වඥ ධාතු ප්‍රදර්ශනය</u>

ධාතු ප්‍රදර්ශනය 2026 පෙබරවාරි 04-11 දක්වා කොළඹ, ගංගාරාම විහාරස්ථානයේදී පැවැත්වේ

ගුජරාට් ප්‍රාන්තයේ ආණ්ඩුකාර ශ්‍රී ආචාර්යා දෙවෙරත් සහ ගුජරාටයේ නියෝජ්‍ය මහ ඇමති හර්ෂ් සංඝවි යන මහත්වරුන් ප්‍රමුඛ ඉන්දීය දූත පිරිසක් ශ්‍රී ලංකාවට

ඉන්දීය අග්‍රාමාත්‍යතුමා විසින් 2025 අප්‍රේල් ශ්‍රී ලංකා සංචාරය අතරතුර සිදු කළ නිවේදනයෙන් අනතුරුව ඉන්දියාව ශ්‍රී ලංකාවේ පැවැත්වෙන පූජනීය දෙවෙනි මෝරි සර්වඥ ධාතු ප්‍රදර්ශනය තුළින් සුවිශේෂී ආධ්‍යාත්මික බැඳීමක් සහ සංස්කෘතික රාජ්‍යතාන්ත්‍රික භාවයක් සමඟින් දෙරට අතර සබඳතා ශක්තිමත් කර ගැනීමට සූදානමින් පසු වේ. ඒ අනුව, වදෝදරා, බරෝදා හි මහරාජා සයාජිරාඕ විශ්වවිද්‍යාලයේ තැන්පත් කර ඇති මෙම ධාතුන් වහන්සේලා 2026 පෙබරවාරි 4 සිට 10 දක්වා පැවැත්වෙන මහජන ප්‍රදර්ශනයක් සඳහා කොළඹට වැඩම කරවන අතර ධාතුන් වහන්සේලා 2026 පෙබරවාරි 11 වන දින නැවතත් ඉන්දියාවට වැඩම කරවීමට නියමිතය. මෙම පූජනීය කර්තව්‍යය බුදු දහම උපන් ස්ථානය ලෙස ඉන්දියාවේ ශිෂ්ටාචාරමය වගකීම මෙන්ම ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පවතින ගැඹුරු ආධ්‍යාත්මික, සංස්කෘතික සහ ජනතා සබඳතා අවධාරණය කරයි.

2. පූජනීය ධාතුන් වහන්සේලා සමඟ ගුජරාට් ප්‍රාන්තයේ ආණ්ඩුකාර ශ්‍රී ආචාර්යා දෙවෙරත් මහතා සහ ගුජරාට් ප්‍රාන්තයේ නියෝජ්‍ය මහ ඇමති හර්ෂ් සංඝවි මහතා ප්‍රමුඛ ඉහළ පෙළේ ඉන්දීය දූත පිරිසක් ද ශ්‍රී ලංකාවට පැමිණෙනු ඇත. මෙම දූත පිරිසට ජ්‍යෙෂ්ඨ භික්ෂූන් වහන්සේලා සහ නිලධාරීන් ද ඇතුළත් වේ. ඉන්දියාව සිය පූජනීය උරුමය සඳහා දක්වන අති මහත් ගෞරවය පිළිබිඹු කරමින් මෙම ධාතුන් වහන්සේලා ඉන්දීය ගුවන් හමුදාවේ විශේෂ ගුවන් යානයකින් පූර්ණ රාජ්‍ය ගෞරව සහිතව ස්ථාපිත නියමයන්ට අනුකූලව ශ්‍රී ලංකාවට වැඩම කරවනු ඇත. දූත පිරිස කොළඹ දී ආගමික සහ නිල කටයුතුවල නිරත වනු ඇති අතර ප්‍රදර්ශනය නිල වශයෙන් විවෘත කිරීම සහ ඉන්දියාවේ බෞද්ධ උරුමය සහ සමකාලීන සංස්කෘතික කටයුතු දැක්වෙන ප්‍රදර්ශන ද ඒ අතරට ඇතුළත් වනු ඇත.

3. ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම සහ සුවිශේෂී ආධ්‍යාත්මික වැදගත්කමකින් යුත් බෞද්ධ විහාරයක් වන කොළඹ, ගංගාරාම විහාරස්ථානයේ දී මෙම ධාතුන්

වහන්සේලා වන්දනා කිරීමේ අවස්ථාව මහජනතාවට උදා වේ. පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල නායක හිමිපාණන් විසින් 19 වන සියවසේ අග භාගයේදී ස්ථාපනය කරන ලද ගංගාරාම විහාරය වන්දනාමාන කිරීමේ, ඉගනීමේ සහ සංස්කෘතික හුවමාරුවේ ප්‍රධාන මධ්‍යස්ථානයක් බවට පත්ව ඇති අතර ප්‍රදර්ශනය සඳහා සුදුසු ගෞරවනීය වටපිටාවක් ලබා දේ. බුදු දහම විසින් සංස්කෘතික ආචාර ධර්මයන්, ඉතිහාසය සහ දෛනික ජීවිතය හැඩගස්වනු ලබන ජාතියක් වශයෙන් ශ්‍රී ලංකාවේ පැවැත්වෙන මෙම ප්‍රදර්ශනය දිවයින පුරා බැතිමතුන්ට ඉතා වටිනා අවස්ථාවක් වනු ඇති අතර දෙරට අතර බෙදා හදා ගන්නා බෞද්ධ උරුමය තවදුරටත් ශක්තිමත් කරනු ඇත.

4. මෙම ධාතූන් වහන්සේලා ගුජරාටයේ අරාවල්ලි දිස්ත්‍රික්කයේ ශාම්ලාජි අසල අති මහත් ඓතිහාසික සහ ආධ්‍යාත්මික වටිනාකමකින් යුත් පුරාවිද්‍යාත්මක ස්ථානයක් වන දෙව්නි මෝරි යන ස්ථානයෙන් සොයා ගන්නා ලදි. ප්‍රවීණ පුරාවිද්‍යාඥ මහාචාර්ය එස්. එන්. චෞද්රි මහතා විසින් 1957 වර්ෂයේ ප්‍රථම වරට සිදු කරන ලද ගවේෂණයක් අතරතුර කැණීම්වලදී වැදගත් බෞද්ධ ව්‍යුහයන් සහ ධාතූන් වහන්සේලා සොයා ගන්නා ලද අතර මෙම සොයාගැනීම් පොදු යුගයේ මුල් සියවස්වලදී බටහිර ඉන්දියාවේ බුදු දහමේ ප්‍රබෝධය සම්බන්ධයෙන් සාක්ෂියක් වේ. මෙම ධාතූන් වහන්සේලා අමිල පුරාවිද්‍යාත්මක සම්පතක් පමණක් නොව සාමය, දයානුකම්පාව සහ සමඟිය පිළිබඳ බුදුන් වහන්සේගේ අකාලික ඉගැන්වීම් පිළිබඳ ජීවමාන සංකේතයක් ද වේ.

5. දෙව්නි මෝරි ස්තූපයෙන් පාදමේ සිට අඩි 24ක උසකින් සොයා ගන්නා ලද ධාතු කරඬුව කොළ පැහැති ශිෂ්ට පාෂාණයෙන් සාදා ඇත. එහි බ්‍රාහ්මී අක්ෂරවලින් සංස්කෘත භාෂාවෙන් "දශබල ශරීර නිලයෙ" එනම්, "බුදුන් වහන්සේගේ ශාරීරික ධාතු වැඩ වසන ස්ථානය" යනුවෙන් සඳහන් කර ඇත. මෙම ධාතු කරඬුව තුළ පූජනීය භෂ්මාවශේෂ ඇතුළත් තඹ පෙට්ටියක් සමඟින් සේද රෙදි කැබැල්ලක් සහ පබළු තිබිණ. ධාතු කරඬුව කොටස් තුනකින් සමන්විත වේ. බඳ කොටස (6.8″ පාදම, 2.9″ උස, 4″ ගැටියේ විෂ්කම්භය), පියන (6.7″ විෂ්කම්භය, 1.05″ ඝනකම, 0.7″ උස) සහ වටකුරු මුදුනක් සහිත බොත්තම (0.66″ උස, 1.1″ විෂ්කම්භය) එම කොටස් තුනයි.

6. තඹ පෙට්ටිය සමතලා මුදුනකින් ද ඇතුළත ගැටියට සවි වන පියනක් සහිත පාදමකින් ද සමන්විත වන අතර එහි සේද රෙදි කැබැල්ලක්, රන් ආලේපිත රිදී-තඹ බෝතලයක්, පූජනීය භෂ්මාවශේෂ සමඟින් ඓන්ද්‍රීය ද්‍රව්‍ය සහ ආවරණයක් ලෙස භාවිතා කළ කළු මැටි තිබිණ. කුඩා රන් ආලේපිත බෝතලය සිලින්ඩරාකාර බඳකින් ද පටු උඩු කොටසකින් සහ කරකවා වැසිය හැකි පියනකින් ද සමන්විත විය.

7. පූජනීය භෂ්මාවශේෂ දැන් ඩෙසිකේටරය තුළ තැන්පත් කර ඇත. ඇතුළත ඇති දෑ තවදුරටත් ක්ෂය වීම වළක්වාලීම සඳහා වාතය ඇතුළු නොවන ලෙස මුද්‍රා තබා ඇත. මෙම වටිනා පූජනීය වස්තූන් තවදුරටත් ආරක්ෂා කිරීම සඳහා ධාතූන් වහන්සේලා

සමඟින් රන් ආලේපිත රිදී-තඹ බෝතලය සහ සේද රෙදි කැබැල්ල කපු පුළුන් මත තබා ඇත.

8. ශ්‍රී ලංකාවේ පැවැත්වෙන දවෙනි මෝරි සර්වඥ ධාතු ප්‍රදර්ශනය ආධ්‍යාත්මික වශයෙන් වැදගත් වන අතරම එය ඉන්දියාවේ සංස්කෘතික රාජ්‍යතාන්ත්‍රික භාවය ඉදිරියට ගෙන යමින් ඉන්දියාවේ ජනතා කේන්ද්‍රීය විදේශ ප්‍රතිපත්තිය යළි අවධාරණය කරයි. ඉන්දියාව සතු අති පූජනීය බෞද්ධ උරුමය ශ්‍රී ලංකාව සමඟ බෙදා ගැනීම තුළින් ඉන්දියාව විශ්වාසය, ඉතිහාසය සහ වටිනාකම් මත ගොඩනැගුණු ද්විපාර්ශ්වික සම්බන්ධතාවයේ ශිෂ්ටාචාරමය පදනම අවධාරණය කරයි. මෙම ප්‍රදර්ශනය ජනතාව අතර ශක්තිමත් සබඳතා ප්‍රවර්ධනය කරමින්, අන්‍යෝන්‍ය විශ්වාසය වැඩි දියුණු කරමින් සහ ප්‍රබල සංස්කෘතික සහ හදවතට සමීප කර්තව්‍යයන් මගින් තිල රාජ්‍යතාන්ත්‍රික තියැලීම් තවදුරටත් ශක්තිමත් කරමින් දරෙට අතර සබඳතා වර්ධනය කිරීමේ මාහැඟි කාර්යයක් වේ. එය ගෝලීය බෞද්ධ උරුමයේ වගකීම් සහගත භාරකරුවකු ලෙස ඉන්දියාවේ කාර්ය භාරය යළිත් අවධාරණය කරන අතර දකුණු ආසියාව තුළ සාමය, ස්ථාවරත්වය සහ සහජීවනය සඳහා ඉන්දියාවේ දැක්ම තුළ වටිනා සහකරුවකු ලෙස ශ්‍රී ලංකාවට හිමි ස්ථානය සහතික කරමින් ඉන්දීය සාගර අසල්වැසි කලාපය තුළ සමඟිය ශක්තිමත් කරයි.

9. ශ්‍රී ලංකාවේ පැවැත්වීමට නියමිත ධාතු ප්‍රදර්ශනය ඉන්දියාව සිය බෞද්ධ උරුමය ලෝකය සමඟ බෙදා ගැනීමේ දිගුකාලීන සම්ප්‍රදාය තවදුරටත් ඉදිරියට ගෙන යයි. මෑත වර්ෂයන් හිදි සර්වඥ ධාතූන් වහන්සේලා මිලියන ගණනක් සැදැහැවතුන්ගේ සහභාගිත්වය සහිතව තායිලන්තය, මොංගෝලියාව, වියට්නාමය, රුසියාව සහ භූතානය යනාදි රටවල්වල ප්‍රදර්ශනය කර ඇති අතර එම ධාතු ප්‍රදර්ශන එම රටවල සහ ඉන්දියාවේ ජනතාව අතර සබඳතා ශක්තිමත් කිරීමට උපකාරී වී ඇත. මෑතකදී, ඉන්දියාව පූජනීය පිප්රාහ්ව ධාතූන් වහන්සේලා නැවතත් ඉන්දියාවට වැඩම කරවූ අතර අග්‍රාමාත්‍යතුමා එම අවස්ථාව හැඳින්වූයේ අමිල ජාතික නිධානයක් නැවතත් මව්රටට වැඩම කරවීමක් ලෙසිනි.

10. මෙම ධාතු ප්‍රදර්ශනය තුළින් ඉන්දියාව සංස්කෘතික රාජ්‍ය තාන්ත්‍රිකභාවය සහ ගෝලීය සමඟිය උදසො සිය කැපවීම යළිත් අවධාරණය කරමින් අවිහිංසාව, දයානුකම්පාව සහ සහජීවනය පිළිබඳ බුදු දහමේ විශ්වීය පණිවිඩය ලබා දෙයි. පූජනීය දවෙනි මෝරි ධාතූන් වහන්සේලා ශ්‍රී ලංකාවට වැඩම කරවීම සාමයේ ප්‍රබල සංකේතයක් ලෙස ද, බෙදා හදා ගන්නා ආධ්‍යාත්මික උරුමයේ සැමරුමක් ලෙස ද සියවස් ගණනාවක් ඉපැරණි ශිෂ්ටාචාරමය බැඳීම් සහ අන්‍යෝන්‍ය ගෞරවය තුළ මුල් බැස ගත් සුවිශේෂී සහ අචල මිත්‍රත්වය යළි සහතික කිරීමක් ලෙස ද හැඳින්විය හැකිය.

***

**කොළඹ**
***2026*** *පෙබරවාරි* ***02***

මූලාශ්‍රය***:***

*https://www.pib.gov.in/PressReleasePage.aspx?PRID=2222243&reg=3&lang=2*